# මානසික දණ්ඩන ක්‍රියාවලියෙහිලා බුදුසමයාගත භික්ෂු දණ්ඩන ක්‍රමවේද පිළිබඳ චුල්ලවග්ගපාළිය ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යයනයක්

**කැලණිය ධම්මගවේසී හිමි[1]**

## හැඳින්වීම

බුද්ධ කාලීන භික්ෂූන්ගේ අශ්‍රමණික ගතිපැවතුම් හේතුවෙන් විවිධාකාර වූ විනය ශික්ෂාවන් පනවන්නට හේතු වූ බව විනය පිටකය අධ්‍යයනයේ දී තහවුරු වේ. භික්ෂූන්ගේ කලහකාරී, වාදකාරී මෙන් ම අශ්‍රමණික ක්‍රියාකාරකම් ශික්ෂාපද බණ්ඩනය කිරීම් හේතුවෙන් විවිධ දණ්ඩන පිළිවෙත් සඳහා භික්ෂූන් බඳුන් කොට ඇති අතර ඊට අදාළ ප්‍රායෝගික විනය ක්‍රියා පිළිවෙත් රාශියකට ද යොමු  කිරීමට සිදු වේ. සඟ වෙසෙස් ආපත්තීන්ට පත් භික්ෂුව පිරිවෙස්, මානත් හා අබ්භාන යන විනය ක්‍රියාපිළිවෙත් ත්‍රිත්වයට හා අශ්‍රමණික ක්‍රියා පිළිවෙත් මූලික කොට ගෙන තජ්ජනීය, නියස්ස හා පබ්බාජනීය ආදී විනය කර්ම සඳහා විනය විධීන් යොදා ගනිමින් මානසික දණ්ඩන ක්‍රියාවලියකට වරද කළ භික්ෂුව පමුණුවයි. එහි ලා වරදෙහි නැවත සංවරය පිණිස (ආයතී සංවරය) උදෙසා භික්ෂුවගේ චර්යාමය පැතිකඩට ඉවහල් වන අයුරින් මෙම දණ්ඩන ක්‍රියාවලිය ඉදිරිපත් වී ඇත. නැවත වරදක් නොකරමින් පිරිසිදු ශ්‍රමණ භූමිකාවකට අවශ්‍ය ප්‍රතිපදාව මෙම විනය පිටකානුගත භික්ෂු දණ්ඩන ක්‍රියාවලීන් ඔස්සේ ස්ඵුට වේ. එහි දී වරදෙහි ආදීනව දැක පිරිසිදු ශ්‍රමණ භූමිකාවකට අවශ්‍ය මඟ පෙන්වීම උක්ත දණ්ඩන ක්‍රියා පිළිවෙත් ඔස්සේ වඩාත් නිරූපිත වේ.

## පර්යේෂණ අරමුණ

ථෙරවාද විනය තුළ භික්ෂුවගේ අශ්‍රමණික ක්‍රියාපිළිවෙත් ඔස්සේ භික්ෂු සංඝයාගේ සංවරය පිණිස ලබා දෙන දණ්ඩන ප්‍රතිපදාවන් ප්‍රකට කරමින් වර්තමාන භික්ෂු සමාජය තුළ ද මෙවැනි ආකාරයේ දණ්ඩන ක්‍රියාපිළිවෙත් ප්‍රායෝගික මට්ටමින් සිදුකිරීමට අවශ්‍ය වපසරිය නිර්මාණය කිරීම. වර්තමාන භික්ෂූන්ගේ දැඩි අප්‍රසාද ජනක චරියා පිළිවෙත් හේතුවෙන් ගිහිපැවිදි සමාජ දිත්වයටම මෙම විනයකර්ම ඔස්සේ ක්‍රියාත්මක වන භික්ෂු දණ්ඩන පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධයක් ලබාදීම.

## පර්යේෂණ ගැටලුව

මෙම භික්ෂු දණ්ඩන ක්‍රමවේදයන් හී වඩාත් උපයෝගී වන්නේ මානසික දණ්ඩනමය ක්‍රියාවලිය ද එසේත් නොමැති නම් කායික දණ්ඩන ක්‍රියා පිළිවෙතකට වරද කළ භික්ෂුව යොමු කිරීම ද යන්න පිළිබඳ මෙහිලා අධ්‍යයනයට ලක් වූ පර්යේෂණ ගැටලුවයි.

1. සිවුවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය. kelaniyadhammagavesi@gmail.com

**පර්යේෂණ ක්‍රමවේදය**

චුල්ලවග්ගපාළියේ කම්මක්ඛන්ධකය, පාරිවාසිකක්ඛන්ධකය හා භික්ෂු ප්‍රාතිමොක්ෂය යන ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය කිරීම හා පිරිවෙස්, මානත් හා අබ්භාන යන විනය කර්මත්‍රයෙ හි ප්‍රායෝගික විනය කර්ම විධි හා ඒ හා සබැඳි චාරිත්‍ර විධි ඔස්සේ භික්ෂු දණ්ඩන ක්‍රියාපිළිවෙත් අධ්‍යයනයට ලක් කෙරුණි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

භික්ෂු දණ්ඩන ක්‍රියාවලින් ඔස්සේ ගම්‍ය වන මානසික හැඩගැස්වීම භික්ෂුවගේ ආකල්ප සංවර්ධනය උදෙසා වඩාත් උපයෝගී වේ. අල්පමාත්‍ර වූ වරදෙහි පවා බිය දක්නා සුළුව, ආචාර්යයෙන් හා ගෝචරයෙන් යුක්තව, කයින් වචනයෙන් නොඉක්මවමින් කටයුතු කිරීමට අවශ්‍ය පදනම විනය ශික්ෂාවන්ගෙන් ලබා දෙන අතර යම් වරදක් සිදු කළ කල්හි ඊට අනුරූපීව දඬුවම් ලබා දීමෙන් භික්ෂුව සතු වගකීම විෂයෙහි උනන්දුවක් ඇති කරයි. මෙම දණ්ඩන ක්‍රියාවලියෙහි ස්වභාවය අංග 18 න් යුක්ත වේ. එය ”අටළොස් වත” වශයෙන් චුල්ලවග්ගපාළියේ විස්තර කරයි. උක්ත දණ්ඩන ක්‍රියාවලීන්ට භාජනය වන භික්ෂුව තමන් වහන්සේ උපාධ්‍යාව උපසම්පදා නොකළ යුතු ය, භික්ඛුනෝවාදක සම්මුතිය පිළි නොගත යුතු ය, විනය කර්මයන්ට නොගැරෙහිය යුතු ය ආදී වශයෙන් ඉදිරිපත් කොට ඇත. මෙමගින් ථෙරවාද බුදුසමයේ ඉදිරිපත් වන දණ්ඩන ක්‍රියාවලියෙ හි පවත්නා විධිමත් කළමනාකරණමය ලක්ෂණය හා වරදට පත් භික්ෂුව තමන්ගේ වැරදි චර්යාවන් වළක්වා ගනිමින් මානසික ශික්ෂණ ක්‍රියාවලියකට භාජනය වෙමින් වත් සම්පූර්ණ කොට වරදින් මිදීමට උත්සාහ කරයි. වරද ඔස්සේ තමන්ගේ ආජීවයට සිදුවූ හානිය අවබෝධ කර ගනියි. එමගින් තමන්ගේ භික්ෂුත්වයට සිදු වූ හානිය වළක්වා ගනිමින් එවැනි වරදකට පත් නොවීමට අවශ්‍ය ශික්ෂණය භික්ෂු දණ්ඩන ක්‍රමවේද ඔස්සේ ලැබේ.

**නිගමනය**

වර්තමාන සමාජයේ පවත්නා සිවිල් දණ්ඩන විධීන් පිළිබඳ අධ්‍යයනයේ දී තහවුරු වූයේ කායික හිංසා මත පදනම් වූ දණ්ඩන ක්‍රියාවලීන් ය. එනමුත් බුදුසමය තුළ කායික දණ්ඩනය ප්‍රතික්ෂේප කොට පුද්ගලයා ස්වයං සංවරයකට පත් කිරීම පිණිස මානසිකමය වශයෙන් පුද්ගලයාගේ වරද අවබෝධ කොට දී භික්ෂුත්වයේ සාඵල්‍යතාවය උදෙසා විධිමත් උපදේශන ක්‍රියාවලියකට භාජනය කරන බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** ථෙරවාද, භික්ෂු දණ්ඩන, මානසික දණ්ඩන, විනයකර්ම, චුල්ලවග්ගපාළිය

**ආශ්‍රිත ග්‍රන්ථ**

ගුණාලංකාර හිමි. විගොඩ, (1959). *පාතිමොක්ඛදීපිකා*, කොළඹ: සමයවර්ධන මුද්‍රණාලය.

*භික්ෂු ප්‍රාතිමොක්ෂය*, (2017). කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනය, අගලවත්ත:

ධම්මපාරායන තිස්ස හිමි. බුජම්පොල, (2010). *ප්‍රාතිමොක්ෂ විවරණය*, මරදාන: රත්න ප්‍රකාශකයෝ.

චන්ද්විමල මහනාහිමි. රේරුකානේ, (2017). *උපසම්පදා සීලය*, පොකුණුවිට: ශ්‍රී චන්ද්විමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය.

චුල්ලවග්ගපාළිය, (1957). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කොළඹ: බුද්ධ සාසන අමාත්‍යාංශය.